www.agaram.lk

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

43949

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

# වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2019
Year End Evaluation

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 09 | විෂයය / பாடம் / Subject: පුරවැසි අධ්‍යාපනය | පත්‍රය / வினாத்தாள் / Paper: I ,II | කාලය / காலம் / Time: පැය 02යි. |

නම :-.................................................... විභාග අංකයඃ-....................................................

සැලකිය යුතුයි.

- I පත්‍රයේ ප්‍රශ්නවලට පිළිතුරු මෙම පත්‍රයේ ම ලියන්න.
- II පත්‍රයට අදාළ පිළිතුරු වෙනම කඩදාසියක ලියා පළමු පත්‍රයේ පිළිතුරු පත්‍රයට අමුණා භාර දෙන්න.

## I පත්‍රය

ප්‍රශ්න අංක 1 සිට 5 දක්වා ප්‍රකාශන නිවැරදි නම් ( ✔ ) ලකුණ ද, වැරදි නම් ( X ) ලකුණ ද ඉදිරියේ ඇති වරහන තුළ යොදන්න.

(01) "සුරකිමු ලකඹර" ශ්‍රී ලංකා නාවික හමුදාවේ ආදර්ශ පාඨයයි. (..............)

(02) බ්‍රිතාන්‍ය ජාතික රොබට් ඕවන් සමූපකාර ව්‍යාපාරයේ පියා ලෙස හඳුන්වයි. (..............)

(03) තම කටයුතු වඩා පහසු කර ගැනීම සඳහා මිනිසා යොදා ගන්නා ක්‍රමවේදය තාක්ෂණය ලෙස හඳුන්වයි. (..............)

(04) නියෝජන ප්‍රජාතන්ත්‍රවාදයේ දී මැතිවරණ මගින් පාලනය සඳහා සහභාගි වීමට ජනතාවට අවස්ථාව හිමිනොවේ. (..............)

(05) කාල කළමණාකරණය හා මූල්‍ය කළමණාකරණය සාර්ථක ජීවිතයකට අත්‍යවශ්‍ය වේ. (..............)

- ප්‍රශ්න අංක 06 සිට 10 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේ දී හිස්තැන්වලට සුදුසු පිළිතුර පහත වරහන් තුළින් තෝරා හිස්තැන් පුරවන්න.

(06) සහජීවනය ආරම්භ වන්නේ ........................................ තුළිනි.

(07) ගරු මර්සලින් ජයකොඩි පියතුමා ........................................ පියතුමා නමින් ද හඳුන්වයි.

(08) ශ්‍රී ලංකාවේ ප්‍රධාන නීති නිලධාරියා වනුයේ ........................................ තුමාය.

(09) කල් පවතින හෙවත් දරාගත හැකි සංවර්ධනය ........................................ සංවර්ධනයයි.

(10) ජාතිය ගොඩනැගීම සඳහා ........................................ ජාතික ප්‍රතිපත්ති මත පිහිටා කටයුතු කිරීම ඉතා වැදගත් ය.

(පාසල, පන්සලේ, අග විනිසුරු, පවුල, නීතිපති, ඌන, තිරසර, එළදායි)



Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk

www.agaram.lk

- ප්‍රශ්න අංක 11 සිට 15 දක්වා ප්‍රශ්න සඳහා වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

(11) ''ඔබ කුමක් කළත් හොඳ කෙනෙක් වන්න'' යන ප්‍රසිද්ධ කියමන ප්‍රකාශ කරනු ලැබුවේ,

(1) ප්‍රැන්ක්ලින් රූස්වෙල්ට් ය. (2) ඒබ්‍රහම් ලින්කන් ය.

(3) ජෝන් එෆ් කෙනඩිය ය. (4) තෝමස් අල්වා එඩිසන් ය.

(12) ''රට වට බැඳි රන් වැට'' යන්න

(1) ශ්‍රී ලංකා නාවික හමුදාවේ ආදර්ශ පාඨයයි. (2) ශ්‍රී ලංකා යුද හමුදාවේ ආදර්ශ පාඨයයි.

(3) ශ්‍රී ලංකා පොලිසියේ ආදර්ශ පාඨයයි. (4) ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ ආදර්ශ පාඨයයි.

(13) මංකොල්ල කෑම, ස්ත්‍රී දූෂණ, ළමා අපයෝජන යන වැරදි සම්බන්ධයෙන් බලපානු ලබන නීතිය වනුයේ,

(1) අන්තර් ජාතික නීතියයි. (2) අපරාධ නීතියයි.

(3) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා නීතියයි. (4) සිවිල් නීතියයි.

(14) A - මුදල් එහා මෙහා ගෙන යාමට වඩා ආරක්ෂාකාරී වේ.

B - තමාට මිලදී ගතහැකි උපරිම ණය ප්‍රමාණය තීරණය වේ.

C - ප්‍රමාණය ඉක්මවා වියදම් කිරීමට පෙළඹීම.

D - පොලී රහිත ගෙවීම් කාල හිමි වේ.

E - දීර්ඝ කාලීනව ණයකරුවෙකු බවට පත්වීම.

ඉහතින් දක්වා ඇත්තේ ණයපත් භාවිතයේ වාසි හා අවාසීන් ය. ඉන් අවාසි පෙන්නුම් කරන ප්‍රකාශ ඇතුළත් අක්ෂර දැක්වෙන පිළිතුර වනුයේ,

(1) A හා B ය. (2) C හා D ය. (3) C හා E ය. (4) A හා E ය.

(15) සීමිත සම්පත් උපරිම අයුරින් ප්‍රයෝජනයට ගැනීම.

(1) ඵලදායිතාවය ලෙස හඳුන්වයි. (2) නිපුණතාවය ලෙස දක්වයි.

(3) කාර්යක්ෂමතාව ලෙස හඳුන්වයි. (4) උපයෝගීතාවය ලෙස හඳුන්වයි.

- ප්‍රශ්න අංක 16 සිට 20 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේදී 'අ' හා 'ආ' තීරු නිවැරදිව ගළපා අදාල ඉංග්‍රීසි අක්ෂරය වරහන තුළ ලියන්න.

| 'අ' තීරුව | | 'ආ' තීරුව |
|---|---|---|
| (16) රාජ්‍ය පාලනය සම්බන්ධ මූලික සිද්ධාන්ත ඇතුලත් උත්තරීතර නීතිය | (..........) | A. අන්‍යෝන්‍ය රැඳියාවයි. |
| | | B. පළාත් පාලන ආයතන වේ. |
| (17) එකිනෙකාට උදව් කර ගනිමින් සහයෝගයෙන් කටයුතු කිරීම | (..........) | C. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා නීතිය ලෙස හඳුන්වයි. |
| (18) ප්‍රාදේශීය අවශ්‍යතා වඩාත් ඵලදායීව හා කාර්යක්ෂමව ඉටු කිරීම සඳහා පිහිටුවා ඇති ආයතන | (..........) | D. ස්ථිරසාරභාවය වේ. |
| (19) ශ්‍රී ලංකාව අතීතයේ සිටම | (..........) | E. බහු සංස්කෘතික රටකි. |
| (20) සමාජයේ පවතින සියලු ම රැකියා අවස්ථා | (..........). | F. වැඩලෝකය ලෙස හැඳින්වේ. |

(ලකුණු 2 x 20 = 40)



Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk

www.agaram.lk

# II කොටස

- පළමු ප්‍රශ්නයට පිළිතුරු ලිවීම අනිවාර්යය වේ.
- තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.
- පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව 5කි.

01. (1) ශ්‍රී ලංකාවේ වර්තමානයේ ක්‍රියාත්මක වන අධිකරණ ආයතන දෙකක් නම් කරන්න.
(2) සමාජ සුරක්ෂිතතාව සඳහා පොලිසියෙන් ඉටුවන කාර්යයන් දෙකක් සඳහන් කරන්න.
(3) රටක ආර්ථිකයක සිදුවන ක්‍රියාවලි තුනෙන් දෙකක් සඳහන් කරන්න.
(4) වර්තමාන රැකියා වෙළෙඳපොළ ප්‍රධාන අංශ දෙකකින් සමන්විත වේ. එම අංශ දෙක ලියන්න.
(5) පාසල් සමුපකාර සමිතියෙන් පාසල් දරුවන්ට ලබාගත හැකි සේවාවන් දෙකක් ලියා දක්වන්න.
(6) ප්‍රජාතන්ත්‍රවාදයේ ප්‍රධාන ස්වරූප දෙක නම් කරන්න.
(7) යහපත් ජීවිතයක් ගත කිරීමට අවශ්‍ය යහජීවන ගුණාංග දෙකක් සඳහන් කරන්න.
(8) සම්මුඛ පරීක්ෂණයකට ඉදිරිපත් වීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු දෙකක් සඳහන් කරන්න.
(ලකුණු 2 x 8 = 16)

02. (i) සමාජ සුරක්ෂිතතාව කෙරෙහි දායක වන ආයතන දෙකක් නම් කරන්න. (ලකුණු 02)
(ii) සමාජ සුරක්ෂිතතාව කෙරෙහි ආගමික ආයතන වලින් සිදුවන කාර්යයන් හතරක් සඳහන් කරන්න. (ලකුණු 04)
(iii) සමාජ විරෝධී ක්‍රියා මැඩ පැවැත්වීමට හා සමාජ සුරක්ෂිතතාව තහවුරු කිරීම සඳහා ක්‍රියාත්මක වන ආයතන දෙකක් දක්වා ඉන් එකක් විස්තර කරන්න. (ලකුණු 05)

03. (i) තාක්ෂණික වෙනස්වීම් නිසා ඇති වන හිතකර බලපෑම් දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02)
(ii) වර්තමානයේ තාක්ෂණය යොදා ගැනෙන අවස්ථා හතරක් ලියන්න. (ලකුණු 04)
(iii) යෝග්‍ය තාක්ෂණය යොදා ගැනීමෙන් අත්වන ප්‍රතිලාභ දෙකක් දක්වා ඉන් එකක් විස්තර කරන්න. (ලකුණු 05)

04. (i) ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ නිර්වචන ඉදිරිපත් කළ විද්වතුන් දෙදෙනකු නම් කරන්න. (ලකුණු 02)
(ii) ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක මූලික ලක්ෂණ හතරක් සඳහන් කරන්න. (ලකුණු 04)
(iii) එම පාලනයේ සාර්ථකත්වය තීරණය වීම කෙරෙහි බලපාන සාධක දෙකක් දක්වා ඉන් එක සාධකයක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05)

05. (i) ශ්‍රී ලංකාවේ වර්තමානයේ ක්‍රියාත්මක වන මැතිවරණ දෙකක් නම් කරන්න. (ලකුණු 02)
(ii) ශ්‍රී ලංකාවේ පුරවැසියකුට ඡන්දබලය ලබා ගැනීම සඳහා සපුරා ගත යුතු සුදුසුකම් හතරක් සඳහන් කරන්න. (ලකුණු 04)
(iii) ඡන්දදායකයන් තම ඡන්දය ප්‍රකාශ කිරීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු දෙකක් දක්වා ඉන් එකක් පිළිබඳව කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05)



Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk

www.agaram.lk

06. (i) වර්ෂ 1987න් පසු ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන පළාත් පාලන ආයතන දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(ii) පළාත් පාලන ආයත්න මගින් අදාළ සේවා ඉටුකිරීමේ දී එම ආයතනවලට හිමි බලතල හතරක් ලියන්න. (ලකුණු 04)

(iii) පළාත්පාලන ආයතන මූල්‍ය සම්පත් උපයා ගන්නා ආකාරය පිළිබඳව නිදසුන් දෙකක් ලියා ඉන් එකක් විස්තර කරන්න. (ලකුණු 05)

07. (i) ගැටුම් ඇතිවන පාර්ශව දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02)

(ii) ගැටුම් ඇතිවීමට බලපාන හේතු හතරක් ලියන්න. (ලකුණු 04)

(iii) ගැටුම් නිරාකරණය සඳහා යෝග්‍ය ක්‍රමවේද දෙකක් සඳහන් කර ඉන් එකක් පිළිබඳ කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05)

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk



agaram.lk